# වාර්ෂික වාර්තාව - 2017



## උද්භිද උද්‍යාන භාර අරමුදල

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## පේරාදෙණිය

# පටුන


| අනු අංකය | | පිටු අංකය |
|---|---|---|
| 1. | හැඳින්වීම | 01 |
| 2. | අරමුදලේ පරමාර්ථ හා මූල්‍ය ප්‍රගතිය | 02 |
| 3. | සුවිශේෂී කර්යය භාර්යයන් | 03 - 04 |
| 4. | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය | 05 - 08 |
| 5. | හක්ගල උද්භිද උද්‍යානය | 09 - 11 |
| 6. | ගම්පහ උද්භිද උද්‍යානය | 12 - 13 |
| 7. | තෙත් කළාපීය උද්භිද උද්‍යානය | 14 |
| 8. | මල් වගා පර්යේෂණ අංශය | 15 - 18 |
| 9. | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය | 19 |
| 10. | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය | 20 |
| 11. | ජාතික ශාකාගාරය | 21 - 23 |
| 12. | 2017 වර්ෂයේ සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය | 24 |

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා වූ භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2017 වර්ෂය

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් 1995.12.15 වැනි දින එවකට කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහාවන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා වූ භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල
2. ස්වභාවය : උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු, සුභ සාධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම
3. අදාල චක්‍රලේඛයන් : I අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව

   II ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය හා 2006.12.22 දින නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/423 අනුව
4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20
5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක 0007040848

**7. අරමුදලේ පරමාර්ථ:**

- ✓ උද්භිද උද්‍යාන පිළිබඳව ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල ඇති ආකල්ප වඩවාලීමට අදාලව ක්‍රියාකාරකම් සිදු කිරීම.
- ✓ පාරිසරික හා අධ්‍යාපනික ලෙස පැළෑටි සංරක්ෂණය සඳහා අර්ථවත් වැඩසටහන් ඇරඹීම හා දියත් කිරීම.
- ✓ උද්භිද උද්‍යානවල සේවය කරන විද්‍යාඥයින්ට තම විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් , පහසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම හා ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ ඕනෑම ද්‍රව්‍යයක් මිලදී ගැනීම.
- ✓ පැළ එකතුව වර්ධනය කරගැනීමට පියවර ගැනීම.
- ✓ තාක්ෂණ ක්ෂේත්‍රවල සිදු කරන උද්භිද උද්‍යාන සංවර්ධනයට තුඩු දෙන පාරිසරික, අධ්‍යාපනික, සංරක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා සහයවීම.
- ✓ විද්‍යාඥයින්ට පහසුකම් සැලසීම හා උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන ජනයාට අවශ්‍ය කරන හදිසි තැනීම් ඉදිකිරීමට පියවර ගැනිම.
- ✓ විශේෂිත වූ වැඩසටහන් සඳහා පුනරාවර්තන අරමුදල් හිඟයන් පිරිමැසීම.

## 2017 වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රගතිය

| | | |
|---|---|---|
| **2017-01-01 දිනට බැර ශේෂය** | **=** | **රු. 153,980,145.33** |
| **එකතු කළා:** | | |
| **2017 වර්ෂයේ ආදායම (බැර කිරීම්)** | **=** | **රු. 172,181,440.00** |
| | | -------------------- |
| **එකතුව** | | **රු. 326,161,585.33** |
| **අඩු කළා :** | | |
| **2017 වර්ෂයේ වියදම් (හර කිරීම්)** | **=** | **රු. 149,969,647.38** |
| | | -------------------- |
| **2017.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය** | **=** | **රු. 176,191,937.97** |

*** (මෙම ශේෂය නාමික ශේෂයක් පමණි)**

උද්භිද උද්‍යාන භාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථයන් ඉටුකර ගැනීම උදෙසා භාර අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2017 වසරේ පහත කාර්යයන් ඉටුකරන ලදී.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය මගින් "වනදිවිය" නමින් මාසික පුවත්පත් අතිරේකයක් මුද්‍රණය කරනු ලබන අතර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙනුවෙන්, එහි වියදමින් කොටසක් උද්භිද උද්‍යාන භාර අරමුදල මඟින් දරන ලදී. මෙම පුවත් පත මඟින් මහජනයා ස්වභාව සෞන්දර්යයට වඩාත් සමීප කිරීමත්, ගහ කොළ පිළිබඳව ඔවුන්ට අවශ්‍ය දැනුම, තොරතුරු ලබා දීමත් සිදු කරනු ලබයි.












වන දිවිය මාසික පුවත්පත් අතිරේකය

- විසිතුරු මල් වගාකරුවන්ට හා මල් වගාව සම්බන්ධව උනන්දුවක් දක්වනු ලබන පාර්ශවයන්ට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා විසිතුරු පත්‍ර ශාක වගාව හා උඩවැඩියා වගාව සම්බන්ධ පොත් 2000 ක් මුද්‍රණය කරන ලදි. මින් ලැබෙන ආදායම උද්භිද උද්‍යාන භාර අරමුදලේ අතිරේක ආදායමක් ලෙස ගිණුම් ගත කෙරේ.

- දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ට දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ වීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමට උද්භිද උද්‍යාන භාර අරමුදල කටයුතු කළ අතර එයින් ඔවුන්ගේ දැනුම,කුසලතා හා ආකල්ප වල වර්ධනයක් සිදු විය.

<u>මූල්‍ය පහසුකම් සලසන ලද පුහුණු වැඩසටහන් සහ වැඩමුළු</u>

- ✓ වියට්නාමයේ පැවති අග්නිදිග ආසියාතික උද්භිද උද්‍යාන සම්මන්ත්‍රණ වැඩමුළුව
- ✓ චීනයේ පැවති උද්භිද උද්‍යාන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වැඩමුළුව
- ✓ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සඳහා මැලේසියාවේ පැවති කළමනාකරණය පිළිබඳ වැඩමුළුව
- ✓ 2017 වසරේ පැවති දෙදින සේවාස්ථ වැඩමුළුව
- ✓ ජාතික ශාකාගාරයේ පැවති "Herbarium Management Techniques" වැඩමුළුව



වාර්ෂික දෙදින සේවාස්ථ පුහුණුවේ දර්ශනයක්

# 2017 වර්ෂයේ අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

## පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

- **අබලන්ව පැවති මාර්ග පද්ධතියෙන් කොටසක් 2016 වසරේ සංවර්ධනය කල අතර, තවත් කොටසක් 2017 වසරේ සංවර්ධනය කිරීමට හැකි විය. ඒ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මඟින් රු. මිලියන 3.4 ක පමණ ප්‍රතිපාදන වෙන් කෙරිණි.**

  **මාර්ග පද්ධතිය සංවර්ධනය වීමත් සමග පහසුවෙන් හා ආරක්ෂාකාරීව උද්‍යානය තුල ගමන් කිරීමට නරඹන්නන්ට ඉඩ ප්‍රස්තාව හිමි විය.**



අළුත්වැඩියා කළ මාර්ග පද්ධතියේ කොටසක්

- නරඹන්නන්ගේ පැමිණීම වැඩි වීමත් සමග උද්‍යානය තුලට පොලිතීන්,ප්ලාස්ටික් වැනි දිරාපත් නොවන දෑ එක්රැස් වීමද සීඝ්‍රයෙන් වැඩි විය.ඒ අනුව කසල බැහැර කිරීම විධිමත්ව සිදු කිරීම සඳහා කසල කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට **2017** වසරේ කටයුතු යොදන ලදී. මේ සඳහා රු.මිලියන **1.6** පමණ යෙදවීමට භාර අරමුදල කටයුතු කර ඇත.



නව කසල කළමනාකරණ බඳුන්

- උද්‍යානයට පැමිණෙන නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු සන්නිවේදනය සඳහා නාම පුවරු ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. රු.මිලියන **0.5** ක පමණ ප්‍රතිපාදන මේ සඳහා වෙන් කෙරිණි.



අළුතින් සවිකළ නාමපුවරු

- **2016 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භකළ මාණ්ඩලික නිල නිවාසය, මෙම වසරේ සම්පූර්ණ කිරීමට හැකි වූ අතර ඒ සඳහා ප්‍රතිපාදන ලෙස රු.මිලියන 5.4 ක් වැය විය. එමෙන්ම රු.මිලියන 4.7 ක් වැය කරමින් රාජකීය උද්භිද උද්‍යානයේ ඇති ඓතිහාසික වටිනාකමකින් යුතු උද්භිද උද්‍යානය ආරම්භ කළ අවධියේ (වර්ෂ 1900 පමණ) ගොඩනැගූ ගොඩනැගිල්ල සංරක්ෂණය කර සංවර්ධනය කිරීමට මෙම වසරේ දී හැකි විය.**



රාජකීය උද්භිද උද්‍යානය ආරම්භයේ ඉදිකළ ගොඩනැගිල්ල අළුත්වැඩියා වෙමින් පවතින අයුරු

- **මෙම වසරේ සිදු වූ තවත් සුවිශේෂී කාර්යයක් වූයේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය තුල ශාක සංරක්ෂණ ගෘහයක් ඉදිකිරීම ඇරඹීමයි. මේ වන විටත් ඒ සඳහා රු.මිලියන 3 ක් පමණ ප්‍රතිපාදන වෙන් කිරීමට උද්භිද උද්‍යාන භාර අරමුදල කටයුතු කර ඇත.**





ශාක සංරක්ෂණ ගෘහයේ වැඩ නිමවෙමින් පවතින දර්ශනයක්

- මීට අමතරව උද්‍යානය අලංකාරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදී.





අලංකාරව පවත්වාගෙන යනු ලබන පේරාදෙණිය උද්භිද උද්‍යානය

- උද්‍යානය නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වන උපකරණ මිලට ගැනීමට ද උද්‍යාන භාර අරමුදල දායක වූ අතර, ඒ සඳහා **2017** වසරේ රු.මිලියන **3.1** ක් පමණ වැය විය.

## හක්ගල උද්භිද උද්‍යානය

- හක්ගල උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ගේ වැඩි වීමත් සමග පෙර පැවති පිවිසුම් මාර්ගයේ දැඩි තදබදයක් ඇති විය. ඊට විසඳුමක් ලෙස නව පිවිසුම් ස්ථානයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. මේ සඳහා ද උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් ප්‍රතිපාදන වෙන් කල අතර ඒ සඳහා රු.මිලියන **6.4** ක් වැය විය.







හක්ගල උද්‍යානයේ ඉදිකළ නව පිවිසුම් මාර්ගය

- රු.මිලියන 0.2 පමණ වැය කරමින් "නොක්ස්" ගිම්හාන කුටිය සංවර්ධනය කිරීමට මෙම වසරේදී කටයුතු කරන ලදී.



නොක්ස් ගිම්හාන කුටිය අළුත්වැඩියාවෙන් පසු

- උද්‍යානය තුලට එක් රැස් වන කසල විධිමත්ව බැහැර කිරීමේදී අවශ්‍යතාව පෙනී යාම හේතුවෙන් ඒ සඳහා කසල කළමනාකරණ පද්ධතියක් උද්‍යානයේ ස්ථාපිත කෙරිණි. ඒ සඳහා රු.මිලියන 4.2 වෙන් කෙරුණු අතර එමඟින් උද්‍යානයේ පවිත්‍රතාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට හැකි විය.



නව කසල කළමනාකරණ ගොඩනැගිල්ලේ දර්ශනයක්

- **උද්‍යානයේ සේවය සඳහා දුර බැහැර ප්‍රදේශ වල සිට පැමිණෙන නිලධාරින්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමේදී දැඩි දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදු විය. එයට විසඳුමක් ලෙස ඔවුන් සඳහා නිල නිවාස ඉදිකිරීමේ කටයුතු මේ වසරේ ආරම්භ කළ අතර, ඒ සඳහා රු.මිලියන 7.7 ක පමණ ප්‍රතිපාදන වෙන් විය.**



**නිවාස 4 කින් සමන්විත ඉදිකරගෙන යනු ලබන නව නිල නිවාසය**

- **උද්‍යානය වටා ඇති ආරක්ෂිත වැට පුළුල් කර විධිමත්ව සකසන ලදී. මේ සඳහා රු.මිලියන 3.2 පමණ වැය කළ අතර මේ හේතුවෙන් උද්‍යානය වඩාත් සුරක්ෂිත විය.**



**විධිමත්ව ඉදිකරන ලද ආරක්ෂිත වැට**

## ගම්පහ උද්භිද උද්‍යානය

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ගම්පහ උද්භිද උද්‍යානයේ උඩවැඩියා ගෘහය ඉදිකිරීමේ කටයුතු මෙම වසරේ කඩිනම් කරන ලදී. එය ඉදිකිරීම සඳහා රු.මිලියන 4.8ක පමණ ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, මේ වන විට එහි 95% ක පමණ වැඩ අවසන් වී ඇත.



ඉදිකිරීම් අවසන් වෙමින් පවතින උඩවැඩියා පැළ ගෘහය

- නරඹන්නන් උද්‍යානය වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් උද්‍යානය තුල නව මල් ආකෘති ව්‍යුහයන් ස්ථාපිත කරන ලදී.මේ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල ප්‍රතිපාදන වෙන් කළ අතර ඒ සඳහා රු.මිලියන 2.5 පමණ වැය විය.



උද්‍යානයට අළුතින් එක්කළ මල් ආකෘති ව්‍යුහයන්

- ගම්පහ උද්‍යානයට මායිම්ව අත්තනගලු ඔය පිහිටා ඇති අතර, ඒ හේතුවෙන් අදාල ප්‍රදේශය ගංවතුර කාල වලදී සෝදා පාළුවට ලක්වන බව දක්නට ලැබුණි. ඒ අනුව අත්තන ගලු ඔයේ ඉවුර සංවර්ධනය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව මෙම වසරේදී ආරම්භ කරන ලදී. ඒ සඳහා රු.මිලියන 5.2 පමණ මේ වසරේ වැය කර ඇත.



සංවර්ධනය වෙමින් පවතින උද්භිද උද්‍යානයට මායිම්ව ඇති අත්තන ගලු ඔය ඉවුරේ දර්ශනයක් (1 වන අදියර වැඩ අවසන් කළ පසු)

- උද්‍යානයේ ඇති පැළ අලෙවි සැල හා සෙවන ගෘහය අළුත්වැඩියා කිරීම සඳහා ද මෙම වසරේ රු.මිලියන 0.5 පමණ ප්‍රතිපාදන යෙදවීමට උද්භිද උද්‍යාන භාර අරමුදල කටයුතු කරන ලදී.
- රු.මිලියන 2.2 ක් පමණ වැය කරමින් උද්‍යානය වටා ඇති බැම්ම ප්‍රතිසංස්කරණය සඳහා මෙම වසරේ කටයුතු කළ අතර ඒ සඳහා ද උද්භිද උද්‍යාන භාර අරමුදල මඟින් ප්‍රතිපාදන යොදවන ලදී.

## අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානය

- **අවිස්සාවේල්ල උද්‍යානය ක්‍රමයෙන් ජනතාව අතර ප්‍රචලිත වෙමින් පවතින අතර, පැමිණෙන නරඹන්නන් හට නව අත්දැකීමක් ලබාදීමේ අරමුණින් බෝට්ටු අංගනයක් ඉදිකිරීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු.මිලියන 2.4 ක් පමණ වැය වී ඇත.**





අවිස්සාවේල්ල උද්‍යානයේ ඉදිකළ බෝට්ටු අංගනය

## මල් වගා පර්යේෂණ අංශය

- **ස්වයං රැකියා ලාභීන් නගා සිටුවීමේ රජයේ ප්‍රතිපත්තිය මත දිවයින පුරා විසිර සිටින මල් වගාකරුවන් නගා සිටුවීම සඳහා විධිමත් වැඩපිළිවලක් ක්‍රියාත්මක කිරීමට මල් වගා අංශය මෙම වසරේදී කටයුතු කරන ලදී.**

**i.** **මල් වගා සමිති සඳහා විවිධ ප්‍රදේශ වල මල් වගා ප්‍රදර්ශන පැවැත්වීමට හා ඒ සඳහා පහසුකම් සැලසීමට කටයුතු කල අතර, ඒ තුලින් ඔවුන්ගේ ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් දකන්ට ලැබුණි.මේ සඳහා රු.මිලියන 1.8 පමණ වෙන් කර තිබුණි.**





**මල් වගා අංශයේ අනුග්‍රහය මත පැවති මල් ප්‍රදර්ශනයක්**

**ii.** **මල් වගා කරුවන් සඳහා උපදේශන සේවා සැපයීම පමණක් නොව ඔවුන්ට අවශ්‍ය වන සෙවන දැල්, මල් පෝච්චි යනාදිය ද බෙදා දීමට මෙම වසරේ කටයුතු කරන ලදී. ඒ තුලින් වැඩි පිරිසක් මල් වගා කටයුතු සඳහා නැඹුරු වූ බවක් දක්නට ලැබුණි.මේ සඳහා රු.මිලියන 10.7 පමණ වැය විය.**






**මල්වගාකරුවන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය බෙදා දීමේ අවස්ථාවක්**

**2017 වර්ෂයේ සුවහස් සමිති සඳහා බෙදා දුන් ද්‍රව්‍ය.**

| අනු අංකය | ප්‍රදේශය | පෝච්චි (20cmx25cmx14.5cm) | UV treated පොලිතින් රෝල් | සෙවන දැල් රෝල් | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | (3mx100m)50% | (3mx100m)60% | (3mx100m)70% | (3mx100m)70% | (3mx100m)80% |
| 1 | කුරුණෑගල | 3500 | 4 | 5,17 m | 5 | 10 | 2,40 m | 4 |
| 2 | අම්පාර | 500 | 2 | - | 1 | 1 | - | 1 |
| 3 | මොණරාගල | 1000 | - | - | - | - | - | - |
| 4 | කෑගල්ල | 3000 | 2 | - | 3 | 6 | - | 16 |
| 5 | මහනුවර | 3000 | 1 | 5 | 5 | 4 | 2 | 4 |
| 6 | රත්නපුර | 300 | - | - | - | - | - | 1 |
| 7 | මාතලේ | 3000 | 1 | 4 | - | - | 1 | 5 |
| 8 | හම්බන්තොට | 7000 | 2 | 4 | - | 8 | - | - |
| 9 | ගම්පහ | 8000 | 4 | 5 | 13 | 52 | - | - |
| 10 | නාරාහේන්පිට | 2500 | 2 | 4 | 7 | 4 | - | 9 |
| 11 | හක්ගල | - | 10 | - | - | - | - | - |
| 12 | මීගලෑව | - | - | - | - | - | - | 2 |
| 13 | පුත්තලම | - | - | - | - | - | - | 7 |
| එකතුව | | 31800 | 28 | 27.17 m | 34 | 85 | 5.40 m | 49 |

- මල් වගා අංශයේ ඉදිකිරීම් හා නවීකරණ කටයුතු වෙනුවෙන් රු.මිලියන 4.7 පමණ ප්‍රතිපාදන වෙන්කිරීමට මෙම වසරේදී හැකි විය.
- එමෙන්ම විද්‍යාගාරයේ නඩත්තු කටයුතු සඳහා සහ රසායනාගාර උපකරණ මිලට ගැනීම සඳහා ද මෙම වසරේදී රු.මිලියන 1.2 ක පමණ ප්‍රතිපාදන ලබා දීමට භාර අරමුදල කටයුතු කර ඇත.

<u>මල් වගා අංශය සිදුකළ පර්යේෂණ කටයුතු</u>

- ✓ මාස 4 – 8 වයසැති ඩෙන්ඩ්‍රෝබියම් මධ්‍යම ප්‍රමාණයේ පැළ වර්ධනය සඳහා පොහොර අනුපාත හා හෝමෝන බලපෑම අධ්‍යනය කිරීම ආරම්භ කරන ලදී.

- ✓ ඔන්සීඩියම් සනයේ ඕකිඩ් පුෂ්ප මංජරිය මගින් පටක රෝපණය කිරීමේ හැකියාව සෙවීම.
- ✓ පිච්ච හා අරලිය දිගු දුර ප්‍රවාහනය කිරීම සඳහා නව ඇසුරුම් ක්‍රමවේද සොයා බැලීම.

- ✓ " Pot puree " සෑදීම සඳහා සුගන්ධවත් පුෂ්ප වර්ග වියළීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීම.

- ✓ *A.adreanum* ශාකයේ බැක්ටීරියා අංගමාරය පාලනය කිරීම සඳහා ශාක නිස්සාරක හා අත්‍යාවශ්‍ය තෙල් වර්ග වල ඇති බැක්ටීරියා නාශක හැකියාව අධ්‍යනය කිරීම.

- ✓ ඩෙන්ඩ්‍රෝබියම් අංකුර පටක රෝපණය සඳහා අර්ධ සාන්ද්‍ර MS මාධ්‍ය හා විවිධ හෝමෝන සාන්ද්‍ර යොදා ගැනීමේ හැකියාව සොයා බැලීම.

- ✓ " Avo Red " ඇන්තූරියම් විශේෂයේ මල් හට ගැනීම ඉහල නැංවීම සඳහා පොහොර අනුපාත හා යොදන ක්‍රමවේදයෙහි බලපෑම සෙවීම.

- ✓ ඇන්තූරියම් හා ඇග්ලොරීමා ශාක වල වර්ධනය සහ විකසනය සඳහා ක්ෂුද්‍ර පෝෂක වල බලපෑම සෙවීම.

- ✓ *Dracaena reflexa* ශාක වල අග්‍රස්ථය ඉවත් කල පසුව අංකුර බෝවීම සහ දිගුවීම සඳහා වර්ධක හෝමෝන වල බලපෑම සෙවීම.

- ✓ ජර්බෙරා විශේෂ 2 ක් පටක රෝපණ කිරීම සඳහා විවිධ මාධ්‍ය සනීකාරක යොදා ගැනීමේ හැකියාව සොයා බැලීම.

- ✓ විසිතුරු වටිනාකමකින් යුතු හා සංරක්ෂණය කල යුතු ශාක විශේෂ පටක රෝපණය සඳහා නව ක්‍රමවේද දියුණු කිරීම. උදා:- කිරිටා,තැඹිලියා,විසිතුරු පත්‍රක ඇන්තූරියම් වර්ග.

- ✓ කැපූ පත්‍ර සඳහා පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම.

- ✓ Bio- film bio-fertilizer යොදා ගැනීම මගින් ආසාධිත පටක රෝපිත ඕකිඩ් හා ඇන්තූරියම් පැළ නැවත යථාතත්වයට ගැනීමේ හැකියාව සොයා බැලීම.

- ✓ *Zamioculcas zamifolia* ශාකය ද්‍රව මාධ්‍යයේ වගා කිරීම මගින් අගය එකතු කල නිෂ්පාදනයක් ලෙස අභ්‍යන්තර අලංකරණ කටයුතු සඳහා යොදා ගැනීමේ හැකියාව සොයා බැලීම.

## අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය

- **මල් වගාව, ගෙවතු අලංකරණය වැනි අංශ කෙරෙහි උනන්දුවක් දක්වනු ලබන පාර්ශව සඳහා පුහුණු පංති, සම්මන්ත්‍රණ හා වැඩසටහන් අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ මැදිහත් වීමෙන් පවත්වනු ලබයි.**

  **එහිදී ඇතිවන මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට භාර අරමුදල කටයුතු කළ අතර, ඒ සඳහා රු.මිලියන 0.7ක් පමණ වැය විය.**





පැවැත්වූ පුහුණු පංතියක දර්ශනයක්

- **අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ද මෙම වසරේ රු.මිලියන 1.2 ක පමණ ප්‍රතිපාදන වෙන් විය.**

## ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

- ඖෂධ පැළෑටි හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම, ව්‍යාප්ත කිරීම, මහජනතාව දැනුවත් කිරීම වැනි සුවිශේෂී සේවාවන් රාශියක් ගනේවත්ත වන ඖෂධ උද්‍යානය මඟින් ඉටුකරනු ලබයි.
- එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා මෙම වසරේදී රු.මිලියන 0.7ක පමණ ප්‍රතිපාදන වෙන්කිරීමට උද්භිද උද්‍යාන භාර අරමුදල කටයුතු කර ඇත.






ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ දේශන පවත්වමින්

## ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය මගින් ශාක සංරක්ෂණය හා පවත්වාගෙන යාම පිළිබඳව සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි. මෙහි කටයුතු පවත්වාගෙන යාම සඳහා 2017 වසරේ දී රු. මිලියන 4.8 පමණ ප්‍රතිපාදන වෙන් කිරීමට භාර අරමුදල කටයුතු කර ඇත.

### 2017 වසරේදී ජාතික ශාකාගාරය මගින් සිදු කළ සුවිශේෂී කාර්යයන්

- ශාක ගවේෂණ වැඩසටහන් යටතේ ක්ෂේත්‍ර ගවේෂණ 23 (එක් දින - 14, දෙදින - 06, තෙදින - 03) ක් සිදු කරන ලදී. එහිදී සජීවී සපුෂ්ප ශාක නිදර්ශක 1,185 , මීවන ශාක නිදර්ශක 113 , පාසි නිදර්ශක 47 ක් එකතු කෙරිණි.
- මෙහිදී තර්ජනයට ලක් වූ ශාක හඳුනා ගැනීම් සිදු කල අතර, වඳවී ගිය ශාක කාණ්ඩයේ ශාක 01 ක් ද, වඳවී ගොස් ඇතැයි සළකන ශාක කාණ්ඩයට අයත් එක් ශාකයක්ද,ඉතා දැඩි ලෙස වඳවී යාමේ අවධානමට ලක් වූ ශාක 07 ක් ද,දැඩි ලෙස වඳවී යාමේ තර්ජනයට ලක් වූ ශාක 60 ක් ද, වඳවී යාමේ තර්ජනයට ලක් වූ ශාක 85 ක් ද, වඳවී යාමේ තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 59 ක් ද හඳුනා ගන්නා ලදී.



උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමේ දී රුමස්සල ක්ෂේත්‍ර ගවේෂණයේදී සොයා ගත් වඳ වී ගොස් ඇති බවට 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea bengalensis* ශාකය

- සපුෂ්ප ශාක 2254, මීවන ශාක 91 ක් සහ පාසි ශාක 225 ක නිදර්ශක හඳුනාගෙන, අදාල නිවරැදි උද්භිද උද්‍යාන නාමයන් විවිධ ආයතන වලට ලබා දෙන ලදී.
- මීට අමතරව නීතිමය කටයුතු 21 ක් සඳහා දැව සාම්පල 102 ක් පරීක්ෂා කර අදාල නිවරැදි හඳුනා ගැනීමේ තොරතුරු ලබා දෙන ලදී.
- ජෛව විවිධත්ව සංරක්ෂණය සහ ශාකාගාර කළමනාකරණය හා තාක්ෂණික ක්‍රම පිළිබඳ වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 25 ක් පවත්වන ලදී. මේ සඳහා පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන් 1174 ක් සහභාගී විය.

- ජාතික ශාකාගාරය මඟින් *"ජාතික රතු දත්ත නාමාවලිය"* ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා මහඟු දායකත්වයක් ලබා දෙමින් ශාක නිදර්ශක ඇගයීම, තොරතුරු රැස් කිරීම,ශාක නාම තහවුරු කිරීමේ කටයුතු කරන ලදී.

- පාසි සංරක්ෂණ වැඩසටහනක් ද ශාකාගාරය මඟින් සිදුකරන ලද අතර ක්ෂේත්‍ර ගවේෂණ වලදී එකතු කර ගන්නා පාසි ශාක විශේෂ එකතුවක් රාජකීය උද්භිද උද්‍යානය තුල ස්ථාපිත කර සංචාරකයන්ට නැරඹීම සඳහා පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

- ජෛව භූගෝල විද්‍යාව (Bio Geography) එක් දින වැඩමුළුවක් කොළඹ පිහිටි ජීව විද්‍යා ආයතනය හා එක්ව සංවිධනය කරන ලදී. මෙහිදී ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ දේශන හා එයට අදාල ප්‍රායෝගික විධි පිළිබඳව දැනුවත් කරන ලදී. මේ සඳහා සම්පත් දායකයින් ලෙස ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලයේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ, ප්‍රාණි විද්‍යාව පිළිබඳ කෞතුකාගාරයේ ආචාර්ය නිකෝ සෙලින්ස් මහතා (Dr. Nico Cellines), දකුණු අප්‍රිකාවේ ක්වාසුලු - නටාල් විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ආචාර්ය රොබට් ඩග්ලස් ස්ටෝන් මහතා (Dr.Robert Douglas Stone) හා ෆ්ලොරීඩා විශ්ව විද්‍යාලයේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාණි විද්‍යාව පිළිබඳ කෞතුකාගාරයේ ප්‍රභා අමරසිංහ මහත්මිය සහභාගී විය.




ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ එක් දින වැඩමුළුව

- ශාකාගාර තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ජාත්‍යන්තර සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් එක් දින වැඩමුළුවක් පවත්වන ලදී. මේ සඳහා ද ෆ්ලොරීඩා විශ්ව විද්‍යාලයේ ආචාර්ය නිකෝ සෙලින්ස් මහතා (Dr. Nico Cellines) සහ දකුණු අප්‍රිකාවේ ක්වාසුලු - නටාල් විශ්ව විද්‍යාලයේ ආචාර්ය රොබට් ඩග්ලස් ස්ටෝන් මහතා (Dr.Robert Douglas Stone) සහභාගී විය.

- කළුවර කුලයට (*Ehanacecu*) අයත් වඳ වී ගෙන යන ශාක, ජාත්‍යන්තර රතු දත්ත විශ්ලේෂණයට අනුව විශ්ලේෂණය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ දින 05 ක වැඩමුළුවක් ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා IUCN ආයතනය එක්ව සංවිධානය කරන ලදී. ජාත්‍යන්තර IUCN සංගමයේ රතු දත්ත විශ්ලේෂණයන් පිළිබඳ විශේෂඥයෙකු වන ඇමරිකාවේ මිසූරි උද්භිද උද්‍යානයේ, ජෝර්ජ් ඊ. ස්කැට්ස් (George E. Schatz) මහතා සම්පත්දායකත්වය ලබා දෙන ලදී. මේ සඳහා ඉන්දියාවේ උද්භිද විද්‍යාඥයින් 4 දෙනෙක් ඇතුලත්ව ශ්‍රී ලංකාවේ විවිධ විශ්ව විද්‍යාල වල විද්වතුන් හා ජාතික ශාකාගාරයේ නිලධාරීන් ඇතුළු 25 දෙනෙකු සහභාගී විය.

- ශාකාගාරයේ අන්තර්ජාතික මට්ටමෙන් දත්ත පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වන බාර්කෝඩ් ලේබල් මිල දී ගෙන, ඒවා අදාල නිදර්ශක මත යෙදීම ආරම්භ කරන ලදී.මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීම, ජාතික ශාකාගාරයේ හා එහි ඇති නිදර්ශක වල ජාත්‍යන්තර වලංගුතාවය සඳහා වැදගත් වේ.

- ශ්‍රී ලංකාවේ මංමාවත් වල බහුලව හමුවන සපුෂ්ප ශාක 100 ක වර්ණ ඡායා රූප සහ විස්තර සහිත "Common Way Side Trees of Sri Lanka " (ශ්‍රී ලංකාවේ සුලබ මාවත් ශාක) පොත සකස් කර මුද්‍රණය කරන ලදී.




මුද්‍රණය කරන ලද "Common Way Side Trees of Sri Lanka " (ශ්‍රී ලංකාවේ සුලබ මාවත් ශාක) පොත

- මධ්‍යම පළාත තුල තෝරාගත් ප්‍රදේශ වල පාසි ශාක වල විවිධත්වය පිළිබිඹු කෙරෙන විද්‍යාත්මක පෝස්ටර් පත්‍රිකාවක් නිර්මාණය කර ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක (27 වන පැසිෆික් වනාන්තර විද්‍යා කොමිසම) ප්‍රදර්ශනය කරන ලදී.

## උද්භිද උද්‍යාන භාර අරමුදල යටතේ 2017 වර්ෂයේදී ඉටුකරන ලද විශේෂ සංවර්ධන ව්‍යාපෘතිවල සාරාංශය

| | කාර්යය | ඇස්තමේන්තුව (රු.) | 2017 -12-31 දිනට මුළු වියදම (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | භාර අරමුදලේ වියදම | **1,015,000.00** | **1,011,104.28** | **3,895.72** |
| 2 | උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරිමේ වියදම | **32,675,000.00** | **32,659,883.26** | **15,116.74** |
| 3 | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | **28,310,000.00** | **28,195,361.14** | **114,638.86** |
| 4 | හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | **35,911,000.00** | **35,889,703.69** | **21,296.31** |
| 5 | ගම්පහ උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | **17,250,000.00** | **17,231,548.38** | **18,451.62** |
| 6 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ සංවර්ධන වියදම | **710,000.00** | **706,966.44** | **3,033.56** |
| 7 | ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම | **4,850,000.00** | **4,841,184.98** | **8,815.02** |
| 8 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධන වියදම | **2,250,000.00** | **2,246,867.02** | **3,132.98** |
| 9 | මල් වගා පුහුණු අංශයේ සංවර්ධන වියදම | **24,626,000.00** | **24,612,131.04** | **13,868.96** |
| 10 | අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | **2,403,000.00** | **2,402,815.87** | **184.13** |
| | එකතුව | **150,000,000.00** | **149,797,566.10** | **202,433.90** |

එස්.හෙට්ටිආරච්චි
උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ සභාපති,
සහ
ලේකම්,
සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය.

ආචාර්ය. එස්. ඒ. ක්‍රිෂ්ණරාජා
උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ ලේකම්,
සහ
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.